- බස්නාහිර පළාත් ආණ්ඩුකාර ගරු හනීෆ් යූසුෆ් මැතිතුමනි,
- අප හිතවත් පළාත් ලේකම්වරුනි,
- නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුනි,
- අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්තුමියනි,
- ITRDA සභාපති වසන්ත දේශප්‍රිය මහතා සහ අනෙකුත් සභාපතිවරුනි ,
- දෙපාර්තමේන්තු ප්‍රධාන මහත්ම -මහත්මීනි,
- LankaPay හි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීතුමනි,
- පළාත් පාලන ආයතන ප්‍රධාන මහත්ම- මහත්මීනි,
- කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුනි,
- මෙහි පැමිණ සිටින සෙසු සම්භාවනීය අමුත්තනි,
- ගෞරවනීය සම්පත්දායකයිනි,
- අපගේ ගෞරවනීය කාර්ය මණ්ඩල සගයන් ඇතුළු සියලුම මහත්ම -මහත්මීනි,

ඔබ සැමට සුභ උදෑසනක්!

ප්‍රථමයෙන්ම, මෙහි පැමිණ සිටින ඔබ සැමදෙනා බස්නාහිර පළාතේ ඩිජිටල්කරණ උපායමාර්ගය පිළිබඳ මෙම සම්මන්ත්‍රණය සඳහා අතිශය හර්දයාංගම ලෙස උණුසුම්ව පිළිගැනීමට මට අවසරයි.

බස්නාහිර පළාත් ආණ්ඩුකාරතුමන් හනීෆ් යූසුෆ් මැතිතුමා ප්‍රමුඛ ඔබ සැම සියලු දෙනා මෙම විශේෂ අවස්ථාව වෙනුවෙන් අප පිළිගන්නේ ඉමහත් ගෞරවයෙන් යුතුවයි.

මෙම අවස්ථාව මඟින් අප මූලාරම්භය සටහන් කරන්නේ, ක්ලීන් ශ්‍රී ලංකා ව්‍යාපෘතියේ අති මූලිකාංගයක් ලෙස සැලකෙන,රාජ්‍ය පාලනය නවීකරණය කිරීම සහ ඩිජිටල් පරිවර්තනය තුළින් මහජනතාවට සේවා සැපයීම වැඩි දියුණු කිරීම සඳහා වන අපගේ සාමූහික ගමනේ අතිශය වැදගත් සන්ධිස්ථානයක්!

ඩිජිටල්කරණයේ ධනාත්මක ප්‍රතිඵල මහජනතාව වෙත ගලා යාම වේගවත් විය යුතු යැයි හදවතින්ම විශ්වාස කරන ආණ්ඩුකාරතුමන්ගේ නායකත්වයෙන් අද අපි මෙහි රැස්වන විට, අනාගතය දෙස නව මානයකින් දකින්නට අප වැනි පරිපාලන නිලධාරීන්ට ශක්තිය ලැබෙනු ඇති.

එනමුත්,අප තරයේ හඳුනාගත යුතු කරුණක් වන්නේ, රාජ්‍ය පරිපාලනයේ අනාගතය කාර්යක්ෂමතාව, විනිවිදභාවය සහ මහජන ප්‍රවේශ්‍යතාව වැඩි දියුණු කිරීම සඳහා හුදෙක් තාක්ෂණය වැළඳ ගැනීම පමණක් ප්‍රමාණවත් වන බව නොවේ,එය ඊට එහා ගිය මානවීය වගකීමක්ද වන බවයි.

තාක්‍ෂණය අප ජීවත් වන සහ වැඩ කරන ආකාරය ප්‍රති අර්ථ දැක්වීමට අඛණ්ඩව කටයුතු කරන යුගයක, ඩිජිටල්කරණය තවදුරටත් සුඛෝපභෝගී දෙයක් නොවේ.

එය සාමාන්‍ය පොදු අවශ්‍යතාවයක් බවට පත්ව අවසන්. එහෙයින්ම, අනෙකුත් සැම ක්ෂේත්‍රයක් මෙන් රාජ්‍ය අංශය ද මහජනතාවට වඩා හොඳින් සේවය කිරීම සඳහා මෙම ධනාත්මක පරිවර්තනය ට අනුගත විය යුතුය යන්න ඔබ මේ වනවිටත්, මනාව වටහා ගෙන ඇති බව මගේ විශ්වාසයයි.

ඒ හේතුව නිසාම, ගෝලීය වශයෙන් දියුණු යැයි සැලකෙන සැම රටකම පාහේ හොඳින් ව්‍යුහගත ඩිජිටල්කරණ උපාය මාර්ග අනුගමනය කිරීම අපට නිරීක්ෂණය කළ හැකියි.

දැන් අප අබිමුව ඇති අභියෝගය වන්නේ, පරිපාලන මෙහෙයුම් විධිමත් කිරීමට පමණක් සීමා නොවී,රාජ්‍ය පාලනය වඩාත් වගකිවයුතු,සීඝ්‍ර ප්‍රතිචාරාත්මක සහ පුරවැසි කේන්ද්‍රීය බව සහතික කළ හැකි තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන ඩිජිටල් වැඩපිළිවෙළකට මග පාදා ගැනීමයි.

ඔබ හොඳින් දන්නා පරිදි, “ක්ලීන් ශ්‍රී ලංකා” වැඩසටහනේ තවත් ප්‍රධාන අරමුණක් වන්නේ දූෂණය තුරන් කිරීමයි.

ඩිජිටල්කරණය මෙම ඉලක්කය සපුරා ගැනීමේදී භාවිත වන ප්‍රබල මෙවලමක් බව අමුතුවෙන් කිව යුතු නෑ.

මානව මැදිහත්වීම් අවම කිරීම, දත්ත ආරක්ෂාව වැඩි දියුණු කිරීම සහ වැඩි විනිවිදභාවයක් සහතික කිරීම මගින්, සුපිළිපන් ඩිජිටල් විසඳුම් මගින් දූෂණය සහ අකාර්යක්ෂමතාව සඳහා ඇති අවස්ථා සැලකිය යුතු ලෙස අඩු කළ හැකියි.

මේ සකලවිධ අරමුණු ඉෂ්ට කරගැන්ම පිණිස අපගේ පාලන රාමුව තුළ ඩිජිටල්කරණයේ සම්පූර්ණ විභවය උපයෝගී කර ගැනීම පරිපාලකයින්, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ නන්විධ පාර්ශ්වකරුවන් ලෙස අපගේ වගකීමක්!

ඒ වෙනුවෙන් අද මෙහි සපැමිණි, ඩිජිටල් පාලන රාමු, උපායමාර්ගික සැලසුම්කරණය සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේද පිළිබඳ ඔවුන්ගේ දැනුම සහ අත්දැකීම් බෙදා ගන්නා අප හිතවත් වසන්ත දේශප්‍රිය මහතාගේ සභාපතිත්වයෙන් හෙබි ITRDA ආයතනයේ ගෞරවනීය විශේෂඥයින් සහ චින්තන නායකයින් මණ්ඩලයක් අප අතර සිටීම අප ලද භාග්‍යයක්!

ආණ්ඩුකාරතුමනි, පරිපාලන සේවයේ දශක ගණනක පළපුරුද්ද සහ අත්දැකීම් සහිත අපගේ වසන්ත දේශප්‍රිය මැතිතුමන්ට මෙම ආයතනයේ සභාපතීත්වය භාරදීමෙන්ම අපගේ කාර්යභාරයෙහි අසීරුම කොටස ඔබතුමන් ජයගෙන ඇති බව මගේ හැඟීමයි.

රාජ්‍ය ආයතනයක් ඩිජිටල් පරිවර්තනයකට ලක් කරන්නට තාක්ෂණික දැනුමට එහා ගිය පරිපාලන ක්ෂේත්‍රයේ සෑම අඩවියක්ම ජයගත් වසන්ත බඳු සහෝදරයන් අපට අවශ්‍යයි.

ආණ්ඩුකාරතුමන්ගේ මග පෙන්වීමෙන්, ITRDA සභායෙන්, අපගේ කාර්ය මණ්ඩලයේ කැපවීමෙන් බස්නාහිර පළාත සඳහා දැනුවත් තීරණ ගැනීමට සහ හොඳින් අර්ථ දක්වා ඇති ඩිජිටල් උපාය මාර්ගයක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මග පෙන්වීම ලැබෙනු ඇතැයි අපගේ අවංක අපේක්ෂාවයි.

මෙම තීරණාත්මක සංවාදය සඳහා ඔවුන්ගේ කාලය සහ විශේෂඥතාව කැප කිරීම වෙනුවෙන් අපගේ සියලුම සම්භාවනීය අමුත්තන්, කථිකයින් සහ සහභාගිවන්නන්ට මගේ හෘදයාංගම කෘතඥතාව පළ කිරීමට මම මෙය අවස්ථාවක් කර ගන්නා අතරම අද ඔබගේ පැමිණීම බස්නාහිර පළාතේ ඩිජිටල් පාලනයේ අනාගතය සඳහා ඔබගේ කැපවීම අවධාරණය කරන බවද සඳහන් කරන්නේ ඉමහත් සතුටින් !

අද සම්මන්ත්‍රණය ආරම්භ කරන විට, වඩාත් කාර්යක්ෂම හා විනිවිද පෙනෙන,සුපිළිපන් පරිපාලනයකට මඟ පාදන ඩිජිටල් පරිවර්තන මාර්ග සිතියමක් සකස් කිරීමේදී ක්‍රියාශීලීව සම්බන්ධ වීමට, අදහස් හුවමාරු කර ගැනීමට සහ සහයෝගයෙන් කටයුතු කිරීමට ඔබ සියලු දෙනාට හැකියාව ලැබෙනු ඇතිය යන්න මගේ විශ්වාසයයි.

අනාගත ශ්‍රී ලංකාවේ ඩිජිටල් පාලනය සඳහා ආදර්ශයක් ලෙස නැගී සිටින බුද්ධිමත්, වඩාත් නව්‍යවාදී බස්නාහිර පළාතක් සඳහා අපි සියලු දෙනා එක්ව, සාමූහිකව කටයුතු කරමු.

ඒ සමඟම, මම ඔබ සැම දෙනා මෙම සුවිශේෂ අවස්ථාවට නැවත වරක් උණුසුම් ලෙස පිළිගන්නා අතර ඔබට නව්‍ය දැනුමෙන් සපිරි, සඵලදායී දිනයක් ප්‍රාර්ථනා කරනුයේ එහි ප්‍රතිඵල හෙට අපගේ පුරවැසි ප්‍රජාව වෙත ලැබේවා ය යන අවංක බලාපොරොත්තුව ද පෙරදැරිව යි.

ඔබ සැමට ජයග්‍රාහී දවසක් !

ස්තුතියි!

**Harsha Wijewardana**

**Secretary,**

**Western Province Provincial Council**